**ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2022**

**-----------------------------------------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් “සමාගම” 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට අනුව පිළියෙළ කිරීමේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහය ගණනය කිරිම සඳහා මුදල් නොවන අයිතම පමණක් ගැලපිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ ගෙවනලද රු.5,440,450 ක් වූ පාරිතෝෂික වටිනාකම මුදල් නොවන ගැලපීම් යටතේ දක්වා තිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලබාගත් මුදල් ප්‍රවාහය තහවුරු කර ගැනීම සඳහා සැබෑ පාරිතෝෂික ගෙවීම අඩු කරනු ලැබේ. රු. 5,440,450 යනු 2022 මූල්‍ය වර්ෂය තුළ සිදු කරන ලද පාරිතෝෂිත ගෙවීම, මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේදී එය අඩු කළ යුතුය. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට අනුව පිළියෙළ කිරීමේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරිම සඳහා මුදල් නොවන අයිතම පමණක් ගැලපිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව 2022 දෙසැම්බර් 30 දින නිකුත් කරන ලද නමුත් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් සහතික කිරීමට පූර්වයෙන් අවලංගු කරන ලද චෙක්පත් 02 ක වටිනාකම වූ රු.226,848,738 ක් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් සමාගමේ මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.226,848,738 ක් අඩුවෙන් දක්වා තිබුණි . | භාණ්ඩාගාරයේ මුදල් නැවත තැන්පත් නොකර මුදල් රඳවා ගැනීමට මෙන්ම 2022 වසර අවසානයේ බැංකු ශේෂය බිංදුවට ගෙන ඒම සඳහා මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇත. | ප්‍රමිතියට අනුකූලව අවලංගු කරන ලද චෙක්පත් නිවැරදිව ගිණුම්වල ගැලපිය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව ස්ථාවර වත්කමක පිරිවැය ගණනය කිරීමේදී වත්කම් පවත්නා තත්ත්වයට හා ස්ථානයට පත් කිරීම සඳහා දරන ලද සියලු වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වුවත් කාර්යාල ගොඩනැගිලි නවීකරණය කිරිම සඳහා උපදේශන සමාගමට ගෙවන ලද රු. 3,302,500 ක මුදල සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br>තවද, ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර වත්කමක ක්ෂය අනුපාතය ගණනය කිරීමේදී වත්කමේ අපේක්ෂිත ආයුකාලය, භෞතික වැහැරීම, තාක්ෂණික හා වාණිජ යල්පැනයාම සහ නීතිමය හා සමාන සීමාවන් සැලකිල්ලට ගතයුතු වුවත් ගොඩනැගිල්ල නවීකරණ කාර්යයට ඇතුළත්ව තිබූ රු. 66,725,736 ක් වූ විදුලි ස්ථාපනයන් සහ සවිකිරීම් | මෙම උපදේශන ගාස්තු 19 සහ 20 වගන්තිවල දක්වා ඇති පරිදි දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය ලෙස නොසැලකෙන වියදම් යටතට වැටේ. ප්‍රායෝගික වශයෙන්, වත්කම් ඒවායේ ස්වභාවය මත පදනම්ව වර්ගීකරණය කර ඇති අතර, වත්කම් කාණ්ඩයේ එක් එක් පන්තිය සඳහා ප්‍රයෝජනවත් ආයු කාලය/ක්ෂයවීම් කාලය තීරණය කරයි. ICTA විසින් වත්කම් විවිධ කාණ්ඩවලට වර්ග කරන අතර, විදුලි ස්ථාපනය සහ සවිකිරීම් යන ගණයට වැටෙන වත්කම් සඳහා වසර පහක ප්‍රයෝජනවත් ආයු කාලයක් පවරනු ලැබේ. ඇතැම් විදුලි ස්ථාපනයන් සහ සවි කිරීම් සඳහා දිගු භාවිතයක් හෝ ආයු කාලයක් තිබිය හැකි බව පිළිගෙන ඇති අතර, ඉඩම් හිමියා සමඟ | ප්‍රමිතියට අනුකූලව ස්ථාවර වත්කමක පිරිවැය ගණනය කිරීමේදී වත්කම් පවත්නා තත්ත්වයට හා ස්ථානයට පත් කිරීම සඳහා දරන ලද සියලු වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (electrical installation and fixtures) ගොඩනැගිල්ලේ ඉදිරි කුලී කාල සීමාව හා එම සවිකිරීම්වල ස්වභාවය පිළිබඳව නොසලකා වසර 05ක් ලෙස ක්ෂය වෙන්කිරීම සඳහා සැලකිල්ලට ගෙන තිබුණි. | ඇති බදු ගිවිසුමේ කොන්දේසි හේතුවෙන් වසර පහක කාල සීමාවකට සීමාවක් පනවනු ලැබේ. ගොඩනැගිල්ලේ සිදු කරන ලද සැලකිය යුතු ආයෝජනයක් සැලකිල්ලට ගනිමින් ඉඩම් හිමියා සමඟ ගිවිසුම දීර්ඝ කිරීමට සැලකිය යුතු විභවයක් ඇති බව සැලකිය යුතු කරුණකි. | |

## 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් සමාගම වෙත ලබාදී තිබුණු රු.32,363,150 ක් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සමාගමේ වෙනත් ආදායම් ගිණුමට ගලපා තිබූ අතර ඒ හේතුවෙන් සමුච්චිත ඌණතාවය අඩු වී තිබුණි. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් නැවත මුදල් ලබාදෙන ලෙස 2022 වර්ෂයේදී ඉල්ලා ඇතත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මෙම මුදල සෘජුවම NIPO වෙත ගෙවන ලෙස තාක්ෂණ අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයට දැනුම් දී ඇත. | ගෙවිය යුතු වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාගම Lanka Government Cloud 2.0 (LGC 2.0) සඳහා වූ රෙඩ් හැට් ඕපන් ස්ටැක් (Red Hat Open Stack) මෘදුකාංගයේ එක් වසරක සහය සහ නඩත්තුව වෙනුවෙන් 2022 අප්‍රේල් 06 දින වී එස් ඉන්ෆෝමේෂන් (පුද්) සමාගම සමඟ රු.12,100,000 ක ගිවිසුමකට එළැඹ තිබුණි. 2022 නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා ගෙවිය යුතු රු.2,016,667 මුදල ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | 2022 මැයි සිට 2022 ඔක්තෝබර් දක්වා කාලය ආවරණය කරමින් පළමු මාස හය සඳහා ගෙවීම් වියදම් ලෙස සටහන් කළෙමු. | ගෙවිය යුතු වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | සමාගමේ වාහන නැවැත්වීම සඳහා ලබාගත් පරිශ්‍රය වෙනුවෙන් ගෙවිය යුතු සමාලෝචිත වර්ෂයේ මාස 07 ක කුලී ගාස්තුව වූ රු.672,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 ජූනි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා වාහන නැවැත්වීමේ ගාස්තු වලට ආදළ ඉන්වොයිසි සැපයුම්කරු විසින් 2023 දෙසැම්බර් දක්වා ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම මෙම වාහන නැවැත්වීමේ ගාස්තු උපචිත ලෙස සටහන් කිරීම මඟ හැරීමට හේතු වී ඇත. | ගෙවිය යුතු වියදම් නිවරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | 2023 වර්ෂයේ ගෙවීම් කරන ලද රු.166,933 ක් වූ 2023 ජනවාරි මාසයට අදාළ ප්‍රවාහන වියදම සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් වියදම් සහ ජංගම වගකීම් වැඩියෙන් දක්වා තිබුණි. | මෙය සිදු වූයේ අතපසු වීමක ප්‍රතිඵලයක් වශයෙනි. | කාලපරිච්ඡේදයට අදාල වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු අරමුදල් රු. 6,284,307 ක් සහ එදිනට වැටුප් සැකසීමේ සමාගමෙන් ලැබිය යුතු ශේෂය රු. 6,284,307 ක් ණය ගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අභ්‍යන්තරව වැටුප් ලේඛනය සැකසීම ආරම්භ කර ඇති බැවින් මෙම ගැටලුව තවදුරටත් අදාළ නොවේ. | ජංගම වත්කම් හා ජංගම බැරකම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.23,964,183 ක් වූ අතර සමුච්චිත අලාභය රු.133,950,492 ක් විය. තවද, 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ ස්කන්ධය රු.133,950,472 ක සෘණ අගයක් ගෙන තිබුණි. එබැවින් තවදුරටත් රාජ්‍ය ප්‍රතිපාදන ලැබීම මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම තීරණය වී තිබුණි. | ICTA යනු රජය විසින් අරමුදල් සපයන සංවිධානයක් බැවින් ICTA හි තිරසාර මෙහෙයුම් රජයේ ප්‍රදාන මත රඳා පවතින බව පිළිගැනීම අත්‍යවශ්‍ය වේ. | අවදානම අවම කර ගැනීමට සමාගම කඩිනමින් පියවර ගත යුතුය. |

### 1.5.4. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය වන විට අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව තිබූ වටිනාකමක් ලෙස , 2019 මූල්‍ය ප්‍රකාශනවල සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක දැක්වුණු රු. 14,809,774 ක් 2019 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ මූල්‍ය තත්ත්වය යටතේ දැක්වෙන සමුච්චිත අලාභය එම වටිනාකමින් වැඩිපුර දැක්වුණි. තවද මෙම වටිනාකම තහවුරු කර ගැනීමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වියදම් විස්තරද විගණනය වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | මෙම ගෙවීම් අමාත්‍යාංශය විසින් පියවා නොතිබීම නිසා 2021 මැයි 20 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් වියදමක් ලෙස ගිණුම් ගත කරන ලදී. | ගණුදෙනුව නිවැරදිව හඳුනා ගෙන ඒ අනුව නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට එකතුව රු.2,775, 096 ක් වූ ණයහිමි ශේෂ 68 ක් නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි. ඉන් රු.2,111,459 ක් වූ ණයහිමි ශේෂ 13 ක් සඳහා ශේෂ තහවුරු කිරීම් විගණනය වෙත සෘජුවම ලැබිය හැකිවන සේ ශේෂ තහවුරු කිරීම් කැඳවීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂය රු. 2,775,096 මගින් 2016 සහ 2019 වසර වල නිකුත් කරන ලද ඉදිරිපත් නොකළ චෙක්පත් 76ක් පිළිබිඹු වේ. නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර නොදක්වන අවස්ථාවකදී ආපසු ලිවීමේ ක්‍රියාවලිය කිරීමට පියවර ගනු ලැබේ. | ණය හිමි ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. ශේෂ තහවුරු කිරීම් විගණනය වෙත සෘජුවම ලැබිය හැකිවන සේ ශේෂ තහවුරු කිරීම් කැඳවීමට කටයුතු කළ යුතුය. |

## 1.6. ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට වෙනත් ගෙවිය යුතු දැ හි 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා හදිසි පරිඝණක ප්‍රතිචාර සංසදය ( ශ්‍රී ලංකා සර්ට්) වෙත ගෙවිය යුතු රු.40,215,928 ක් නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි. | CERT වෙත ගෙවිය යුතු ගිණුම් දෝෂයක් හේතුවෙන් පැන නැගී ඇත. තාක්ෂණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවේ සාකච්ඡාවලින් පසුව මෙම ගැටළුව විසඳනු ඇත. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය | පනත ප්‍රකාරව එක් එක් ලිත් වර්ෂයකටම වරක් කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු නමුත් සමාගම 2017 වර්ෂයේ සිට වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා නොතිබුණු අතර 2021 වර්ෂය සඳහා මහා සභා රැස්වීමක් 2023 නොවැම්බර් 07 දින පවත්වා තිබුණි. | මූල්‍ය ගිණුම් සකස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීම ප්‍රමාද විය. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ වාර්ෂික මහා සභා රැස්වීම 2023 නොවැම්බර් 7 වැනි දින පැවැත්විණි. 2022 වර්ෂය සඳහා වන විගණනය අවසන් වූ පසු 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරිම සඳහා කැඳවනු ලැබේ. | සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව එක් එක් ලිත් වර්ෂයකටම වරක් කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. |
| ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක:01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය 2.3 ඡේදය | විධිවිධානයන් ප්‍රකාරව උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය වසර ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද, සමාගම සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛය ප්‍රකාරව අයවැය පිළියෙළ කර නොතිබුණි. | 2020 සිට 2024 දක්වා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඇත. මෙම සංශෝධිත උපායමාර්ගික සැලැස්මට 2023 ජූලි 18 වැනි දින පැවති රැස්වීමකදී මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණි. මෙම උපායමාර්ගික සැලැස්ම සඳහා මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයක් ඇති බව පිළිගනිමි. චක්‍රලේඛ මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි නියමිත මූල්‍ය වාර්තාකරණයට අනුකූලව කටයුතු කර නොමැති බව අපි පිළිගනිමු. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය වසර ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක:01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොත | | | |
| | i) 3.2 ඡේදය | සමාගම සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියක් හා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් නොතිබුණි. | බඳවා ගැනීමේ ක්‍රමයක් (SOR) ක්‍රියාත්මක නොවූ නමුත් 2020 නොවැම්බර් 04 බලපැවැත්වෙන පරිදි කැබිනට් අනුමත කාර්යමණ්ඩලයක් පැවතුණි. 2023 දෙසැම්බර් 4 වැනි දින තාක්ෂණ අමාත්‍යාංශය (MOT) හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (PED) වෙත ඉදිරිපත් කරන ලද අනුමත SOR බඳවා ගැනීමේ ක්‍රමයක් පවතී. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව සමාගම කාර්යමණ්ඩල සංඛ්‍යාව සහ බඳවාගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගත යුතුය. |
| ii) | 3.5 ඡේදය. | විධිවිධානයන්ට අනුකූලව රජය සතු ව්‍යවසායන්හි (SOE) සේවකයෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොමැතිව නිදහස් නොකළ යුතු අතර මුදාහරින ලද කාලපරිච්ඡේදයන් තුළ කිසිදු දීමනාවක් නොගෙවිය යුතු නමුත් සමාගම නිලධාරිනියන් දෙදෙනෙකු අනුමැතිය නොමැතිව තාක්ෂණ අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දුරකථන දීමනා ලෙස රු.2,560,000 ක් වැයකර තිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම අනුව සේවකයින් දෙදෙනාම තාක්ෂණ අමාත්‍යාංශය වෙත මුදා හැරීමට සිදු විය. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව රජය සතු ව්‍යවසායන්හි (SOE) සේවකයෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොමැතිව නිදහස් නොකළ යුතුය.<br>ගෙවූ වැටුප් හා දීමනා අය කර ගත යුතුය. |
| iii) | 3.8 ඡේදය. | රජය සතු ව්‍යවසායන්හි සේවකයින්ට සන්නිවේදන පහසුකම් කලින් කළ නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ මත පදනම් විය යුතු වුවද, සමාගම චක්‍රලේඛ ප්‍රතිපාදන නොමැති ව්‍යාපෘති නිලධාරි/ව්‍යාපෘති සහායක සහ රියදුරු කාර්යය මණ්ඩලයටද දුරකථන දීමනා ගෙවා තිබුණි. | 2022 ජූලි මාසයේ සිට වැටුප් වර්ධකයක් ලැබී නොමැති, අඩුම වැටුප් ලබන සේවකයින්ට මෙම දීමනාව ගෙවා ඇත.<br>ඉදිරියේදී මෙම සේවකයින්ට වැටුප් වර්ධකයක් ලබාදුන් පසු එම සේවකයින්ගේ ජංගම දුරකථන දීමනාව ඉවත් කිරීමට කරමි. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව රජය සතු ව්‍යවසායන්හි සේවකයින්ට සන්නිවේදන පහසුකම් කලින් කළ නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ මත පදනම් විය යුතු යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 20,629,927 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 41,648,126 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,018,199 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සන්නිවේදන වියදම රු. 685,927,956 කින් එනම් සියයට 58කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ නිලධාරීන් දෙදෙනෙකු සේවයෙන් ඉවත්කිරීම සම්බන්ධයෙන් සමාගමට එරෙහිව පවරා තිබූ නඩුවලට අදාළ නඩු තීන්දු අනුව සමාලෝචිත වර්ෂයේ රු.18,870,000 ක් ගෙවීමට සිදු වී තිබූ අතර මෙම නඩු සඳහා සමාගම සමාලෝචිත වර්ෂයේ නීතිමය ගාස්තු වශයෙන් රු.1,070,000 ක් ද දරා තිබුණි. | අධිකරණ තීන්දුව මත පදනම්ව ගෙවිය යුතු යුතුවීම නිසා ගෙවීම් කර ඇත. මණ්ඩලය විසින් ගෙවීම් අනුමත කර ඇත. | මෙවැනි වියදම් ඇති වීම වළක්වා ගත යුතු අතර කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යා යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අංක 22 දරන සමාජ ආරක්ෂණ බදු පනත අනුව සමාජ ආරක්ෂණ බද්ද, පිරිවැටුමට අදාළව ක්‍රියාත්මක විය යුත්තේ 2022 ඔක්තෝබර් 01 දින සිට වුවද සමාගම රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියට (Management and operation of Government Information Centre ) අදාළ සේවා සැපයීම් වෙනුවෙන් සමාගම වෙත ඉදිරිපත් කරන ලද 2022 අප්‍රේල් සිට සැප්තැම්බර් මාසයන්ට අදාළ ඉන්වොයිස්පත් වෙනුවෙන් රු. 855,491ක සමාජ ආරක්ෂණ බද්ද ගෙවා තිබුණි. තවද, මේ හේතුවෙන් එම ඉන්වොයිස්පත් වෙනුවෙන් එකතුකළ අගය මත බද්ද රු.128,323 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මෙම ඉන්වොයිසි 2022 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලයට අදාළ වුවද, සේවා සපයන සමාගම විසින් 2022 දෙසැම්බර් මාසයේදී අදාළ සියලුම ඉන්වොයිසි නිකුත් කර ඇත. දඩ ගාස්තු තීරණය කිරීමේ ප්‍රමාදය මෙම ඉන්වොයිසි ඉහළ නැංවීම ප්‍රමාද වීමට හේතු විය. SSL 2022 ඔක්තෝම්බර් 1 දින සිට ක්‍රියාත්මක වූ බැවින්, 2022 දෙසැම්බර් මාසයේ රැස් කරන ලද ඉන්වොයිසි සඳහා SSL යෙදීමට සේවා සපයන සමාගමට සිදුවිය. | සමාගමට අවාසි සහගත තත්වයන් ඇතිවීම හැකි පමණ අවම කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ කාර්ය මණ්ඩල වැටුප් සැකසීම හා ගෙවීමේ කාර්යය විධිමත් ගිවිසුමකින් ද තොරව බාහිර සමාගමකින් ඉටු කරවා ගන්නා අතර එයට අදාළ ගාස්තුවද ඇතුළුව වැටුප් ගෙවීමට අදාල මුදල රු.මි. 414 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. එම | ICTA වෙනුවෙන් වැටුප් සහ අදාළ ගෙවීම් සකස් කරමින් සිටි පෞද්ගලික සමාගමේ සේවය 2023 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කර ඇත. මුදල් අමාත්‍යාංශයේ විද්‍යුත් පඩිපත් ක්‍රමය 2023 | රජයේ අරමුදල් පෞද්ගලික පාර්ශවයන්ගේ බැංකු ගිණුම් වල රඳවා ගැනීමේ අවස්ථා අවම කර කාර්යය නිම කළ වහාම පෞද්ගලික පාර්ශවය වෙත |

| | | | |
|---|---|---|---|
| | සමාගම විසින් මාසිකව සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල්, වැටුප් ගෙවීමේ කාර්යය අවසන් වූ වහාම, එම අරමුදල් වෙත ප්‍රේෂණය නොකර දෛනිකව රු.මි. 5.80 සිට රු.මි. 14.65 ක් පමණ මුදලක් දින 31 සිට 53 ක් අතර කාලයක් වැටුප් සැකසීමේ සමාගමේ රඳවාගෙන තිබුණි. | ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක කර ඇත. | තිබූ වැඩිපුර මුදල් සමාගමට වහාම ප්‍රේෂණය කර ගත යුතුය. |
| (ආ) | 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICTA) පනත ප්‍රකාරව මුළුමනින්ම මහාභාණ්ඩාගාරයට අයත් සමාගමක් ලෙස 2003 මැයි මස 12 වන දින ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පිහිටුවා තිබුණි. 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනත යටතේ පිහිටුවා තිබුණු තොරතුරු තාක්ෂණ සභාවට (සින්ටෙක්) අයත් සියලු වංචල හා නිශ්චල දේපළ සහ සභාවේ සියළු වත්කම් සහ බැරකම් සමාගම (ICTA) වෙත පවරා තිබුණද සභාවේ එම ශුද්ධ වත්කම් ශේෂය වූ රු.5,744,115 ක් සමාගමේ ස්කන්ධයට නොගලපා අතිරික්තයට ගලපා තිබුණි. | විශේෂයෙන්ම ICTA රජය සතු පුද්ගලික සමාගමක් බව සලකන විට, CINTEC හි ශුද්ධ වත්කම් ICTA තුළ යොදවා ඇති ප්‍රාග්ධනය ලෙස ඇතුළත් කිරීමට නීතිමය හැකියාවක් නොමැත. විස්තීරණය කිරීම සඳහා, CINTEC හි වත්කම් ICTA හි ගිණුම් වාර්තාවලට ඒකාබද්ධ කර ඇති අතර, CINTEC හි අනුරූප වගකීම් ICTA හි ගිණුම් පොත් තුළ ගිණුම්ගත කර ඇත. ශුද්ධ වත්කම් (වත්කම් අඩු වගකීම්) ICTA හි සංචිතවලට නිසි ලෙස මාරු කර ඇත. | රජයේ වෙනත් ආයතනයක වත්කම් වගකීම් පැවරීම ආරම්භක ප්‍රාග්ධනය යෙදවීමක් බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | "ඊ - පුස්තකාල" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බිල් ඇන්ඩ් මෙලින්ඩා ගේට්ස් ෆවුන්ඩේෂන් ලබාදී තිබූ රු. 121,582,863 ක් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සමාගමේ වෙනත් ආදායම් ගිණුමට ගලපා තිබූ අතර ඒ හේතුවෙන් සමුච්චිත ඌණතාවය අඩු වී තිබුණි. | Bill & Melinda Gates Foundation විසින් මෙම අරමුදල් පරිත්‍යාගයක් ලෙස ලබා දී ඇත. | ව්‍යාපෘති සඳහා ලද මුදල් නිවරදිව ගිණුම් ගත කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්ය මණ්ඩලය 235 ක් සඳහා ප්‍රමාණවත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය කාර්යමණ්ඩලය 106 ක්වූ බැවින් ව.අඩි.10320 ක් සඳහා ගොඩනැගිලි කුලිය රු.21,054,840 ක් නිශ්කාර්යව ගෙවා තිබුණු අතර රු.16,048,194 ක පමණ වටිනා කාර්යාල ගෘහ භාණ්ඩද ඌන උපයෝජිතව පැවැතුණි. | කාර්ය මණ්ඩලයට වෙන් කර ඇති වැඩ අවකාශයෙන් ඔබ්බට, පරිශ්‍රය තුළ පොදු අවකාශයන් පවතී, උදාහරණයක් ලෙස රැස්වීම් කාමර, දිවා ආහාර කාමර, ශ්‍රවණාගාරය, ආපනශාලා, සේදුම් කාමර, කොරිඩෝ යනාදී ලෙස මුළු වර්ග අඩි ප්‍රමාණය කාර්ය මණ්ඩලයට අවශ්‍ය පදිංචිය ඉක්මවා යයි. | වත්කම් උපරිම අයුරින් උපයෝජනය කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 ප්‍රකාරව ශ්‍රී ලංකා රජයේ මුදල් යොදවනු ලබන ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගතයුතු වුවත් සමාගමේ කාර්යාල ගොඩනැගිල්ල රු.115,070,334 ක් වැයකර කාර්යාල පරිශ්‍රයක් ලෙස නවීකරණය කර තිබූ අතර ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2020 ජනවාරි 13 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ අංක PS/GPA/චක්‍රලේඛය/01/2020 මත පදනම්ව, 2020 දෙසැම්බර් 1 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය/අනුමත අංක AMP/20/1784/301/012 සහ ICTA ප්‍රධාන විධායක නිලධාරියාගේ අනුමැතිය මත ප්‍රතිසංස්කරණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ICTA ප්‍රධාන විධායක නිලධාරියාගේ අනුමැතිය සලකා බැලීමෙන්, ප්‍රසම්පාදන ඒකකය උපකල්පනය කළේ, ඉහත චක්‍රලේඛය වෙත ලබා දී ඇති ප්‍රමුඛතම වැඩ පැවරුම් සලකා බලා, ප්‍රතිසංස්කරණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා පිළිගත් අනුමැතිය දැනටමත් පවතින බවයි. | සියළු ප්‍රසම්පාදන, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | සමාගමේ ප්‍රවාහන ඇනිය සඳහා වාහන ලබාගැනීමට පෞද්ගලික සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුමේ කාලය 2018 පෙබරවාරි 28 දිනෙන් අවසන් වුවද, එම ගිවිසුම් කාලය දීර්ඝ කිරීමක් හෝ 2006 ජනවාරි 25 දිනැති අංක 08 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමකින් තොරව තවදුරටත් 2022 වර්ෂයේදී වාහන 5ක් කුලී පදනම මත ලබාගෙන රු.6,090,084 ක් වැයකර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. කෙසේ වෙතත් 2023 අගෝස්තු 1 වන දින සිට නිසි අනුමත ක්‍රියා පටිපාටි අනුගමනය කරන බව සහතික කිරීමට පරිපාලන දෙපාර්තමේන්තුව දැනටමත් පියවර ගෙන ඇත. | සියළු ප්‍රසම්පාදනයන් මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කළ යුතුය. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 4.2.2(අ) ප්‍රකාරව එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාව සම්බන්ධව කාලානුක්‍රමික අනුපිළිවෙලින්, පියවරයන් විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කළ යුතු වුවත් විගණනය කරන ලද එකතුව රු.9,578,856 ක් වූ ප්‍රසම්පාදන 03 ක් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අනාගතයේදී මෙම නිරීක්ෂණය නිවැරදි කිරීමට සහතික වනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සියළු ප්‍රසම්පාදන සඳහා කාලසටහනක් සකස් කළ යුතුය. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමකින් සහ ගිවිසුමකට එළඹීමකින් තොරව වාහන නැවැත්වීම සඳහා පෞද්ගලික පාර්ශවයකින් රු.96,000 ක මාසික කුලියකට ඉඩමක් ලබාගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.1,152,000 ක් වැයකර තිබුණි. | 2024 ජනවාරි 01 දින සිට මෙම වාහන නැවැත්වීමේ පහසුකම අත්හිටුවා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 01 දිනැති අංක:අමප/20/1784/301/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව භාණ්ඩාගාරයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබානොගෙන කොන්ත්‍රාත් සේවා කාලය සමාගමේ සේවා කාලය ලෙස ගණන් ගන්නා බව දක්වා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයෙන් 69 දෙනෙකුට 2021 ජනවාරි 01 දින සිට ස්ථිර පත්වීම් ලබා දී තිබුණු අතර 2003 ජුනි 03 දිනැති අංක:PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබානොගෙන ස්ථිර කාර්ය මණ්ඩලයට නියමිත වැටුප් ශ්‍රේණියේ ආරම්භක පියවරේ නොතබා ලබමින් සිටි කොන්ත්‍රාත් වැටුපට වඩා සියයට 0 සිට සියයට 87 දක්වා වැඩි වැටුප් තලවල පිහිටුවා නව වැටුප් ව්‍යුහයන් හඳුන්වා දී තිබුණි.<br>තවද, 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2(iv) ඡේදය ප්‍රකාරව වැටුප් වැඩිකිරීමේ ඉල්ලීම භාණ්ඩාගාර ලේකම් සභාපතිවන කමිටුවට යොමුකර නොතිබුණු අතර ඒ ඒ නිලධාරියා සඳහා යෝජිත වැටුප් වර්ධකය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබානොගෙන 2022 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්යය මණ්ඩලය වෙත වැටුප් වර්ධක ලබා දි තිබුණි | කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ICTA හි ප්‍රඥප්තිය සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගැනීමේ අවශ්‍යතාවය පැවතුණි.<br>වැටුප් වර්ධක ලබාදීමේදී නිසි අනුමත ක්‍රියාපටිපාටි අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය කිරීම සමග එකඟ වේ. | අමාත්‍ය මණ්ඩල තීරණය හා චක්‍රලේඛ ප්‍රකාරව නියමිත වැටුප් තලයේ පිහිටුවා නව වැටුප් ව්‍යුහයන් හඳුන්වා දිය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත වාර්ෂික වාර්තාව සහ ගිණුම් කෙටුම්පත් විගණකාධිපති වෙත භාර දිය යුතු වුවද, සමාගම දින 294 කට පසු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | ඉකුත් වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කිරීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. | මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන වලට අනුකූලව මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත භාර දිය යුතුය. |